# මුහුණට මුහුණ

## ශ්‍රීනාත් මද්දුමගේ

ජනවාරි 20 වන දා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ මිනි තියටර් හිදී නුඹ ළඟ මං නමින් සංයුක්ත තැටියක් එළිදැක්වුණා. එහිදී විශේෂ දේශණය කරමින් ජයලත් මනෝරත්නයන් පැවසුවේ මෙම හඬ සිංහල ගීතයට මනාවට ගැලපෙන මනා



ලෙස පුහුණු වූ හඬක් බවයි. මෙය ඇසූ විට අපට ද දැනුණේ සියුම් සතුටක්. මේ සතුට වඩාත් තීව්‍ර වූයේ ඇගේ සංගත තැටිය ශ්‍රවණය කරන්නට ලබීමෙන් පසුවයි. මෙම ගායිකාව සැම පොදු කටයුත්තකදී ම ජාති ආගම් කුල බේධ නොතකා තමන්ට හැකි පමණින් සහභාගි වන උපකාරී වන ශිරෝමා ප්‍රනාන්දු නම් වූ ඇය යි.

**ශ්‍රීනාත්**
කොහොමද මේ ගීත ගායනා කිරීමේ හැකියාව ඇතිවුණේ?
**ශිරෝමා**
මේක අපේ පවුලෙන් ආව දෙයක් කිව්වොත් නිවරදියි. අපේ අම්මට හොඳට ගීත ගායනා කරන්න පුළුවන්. ඒ වගේම මේ වෙලාවෙ පල්ලිය අමතක කරන්න බැහැ. අවුරුදු 7 ඉඳන් මම පල්ලියෙ කන්තාරු කණ්ඩායමේ හිටියා.

**ශ්‍රීනාත්**
එහෙනම් ගායනය පිළිබඳව මනා පුහුණුවක් ලැබෙන්න ඇති නේද?
**ශිරෝමි**
ඔව්. . හුඟාක් ජනප්‍රිය වෙච්ච ගායක ගායිකාවො වැඩි පිරිසක් පල්ලියේ කන්තාරු කණ්ඩායම් වල හිටි අයයි. මම එහෙම කියන්නෙ පල්ලියෙදී ගීතිකා ගායනා කිරීම විතරක් නෙවෙයි සංගීතය ගැනත් යම් අවබෝධයක් ලැබෙන නිසයි.

**ශ්‍රීනාත්**
ඔබ මුලින්ම ගායනා කළ ගීතය මතකද?
**ශිරෝමි**
ම මුලින්ම ගායනා කළේ බුදුහාමුදුරුවනේ කියන ගීතයයි. තනුව හා සංගීත අධ්‍යක්ෂණය කළේ අපත් සමග වෙසෙන සුනිල් වීරසූරිය මහතායි. මේ වෙලාවෙ මම මතක් කරන්න ඔනෙ මගේ ගායන දිවියට අත දුන් ඒ මහතාව.

**ශ්‍රීනාත්**
එතකොට මේ ගීතය රචනා කළේ ඔබ ද?
**ශිරෝමි**
ඔව්. ඒ විතරක් නෙවෙයි මේ සංයුක්ත තැටියේ ගීත විශාල ප්‍රමාණයක් රචනා කළේ මම මයි. මේවා අද ඊයේ රචනා කළ ඒවා නෙවෙයි. අවුරුදු 20ක් තිස්සේ මම සැරින් සැරේ ලියපු ගීත වලින් එකතු කර ගත් ඒවා.

**ශ්‍රීනාත්**
ගී තනු?
**ශිරෝමා**
මේ සංයුක්ත තැටියේ එන ගීත වලින් තනු අටක් නවයක් මම විසින්ම නිර්මාණය කළ ඒවා. නමුත් මේවා යේ අඩුපාඩු හදලා සංගීත සංයෙ-ර්ජනය කළේ විශාරද රෝහණ ධර්මකීර්ති මහතායි. මේ සංයුක්ත තැටිය එළි දක්වන්නට රෝහණ ධර්මකීර්ති මහතා විශාල කැපවීමක් කළා. මගේ කෘතඥතාව ඔහුට පිරිනමනවා.

**ශ්‍රීනාත්**
මේ සංයුක්ත තැටියට යුග ගායනයෙන් හවුල් වන ශිල්පීන් කවු ද?
**ශිරෝමා**
වික්ටර් රත්නායක රෝහණ වීරසිංහ එඩ්වඩ් ජයකොඩි දීපිකා ප්‍රියදර්ශණී රෝහණ බෝගොඩ නෙලු අධිකාරි මහින්ද බණ්ඩාර මෙහිදී රෝහණ වීරසිංහ වික්ටර් රත්නායක හා කැමරන් කොළඹගේ යන මහත්වරු ගීත කීපයකට තනු නිර්මාණය කළා.

**ශ්‍රීනාත්**
ඉතිරි ගීත ලිව්වෙ කව්ද?
**ශිරෝමා**
ජගත් ජේ එදිරිසිංහ. පද්මසිරි හේරත්. වරුණ සාවින්ද. සිසිර දිසානායක. ට්‍රීසා කටුනායක. මේ අයටත් මම මේ අවස්ථාව කරගන්නවා ස්තුති කරන්න.

**ශ්‍රීනාත්**
ඔබ නාට්‍ය වලටත් සම්බන්ධ වුණා නේද?
**ශිරෝමා**
ඔව්. මම ස්කැට් සංවිධානය විසින් සංවිධානය කළ කෙටි නාට්‍ය උළෙලට නපුරු දෙපා සත්තු සහ වැල්ල බඩ මිනිස්සු යන නාට්‍ය ඉදිරිපත් කළා. ඒ වගේම මහාසාර නාට්‍යයේ මම ගායක කණ්ඩායමේ හිටියා. ඒ එක්කම ගුවන් විදුලි වැඩ සටහන් වලටත් සම්බන්ධ වුණා. මේ වෙලාවෙ මම ස්තුති කරන්න ඕනෙ ස්කැට්ස් සංවිධානයටත් ගුවන් විදුලියට මා සම්බන්ධ කරගත් අසෝක සිල්වා මහතාටත් ගුවන්විදුලි නාට්‍ය වලට මා සම්බන්ධ කරගත් බන්දු මුතුතන්ත්‍රී මහතාටත්. පැතුම් තිලකසිරි

## නුඹ ළඟ මං

### ඔබ සැමදා අප ළඟයි ශිරෝමා

මහතාටත් ජයශ්‍රී චන්ද්‍රජිත් මහතාටත් මම ස්තුතිවන්ත වෙනවා. මාව ටෙලිනාට්‍යයකට සම්බන්ධ කරගත් සුජාතා සජාතා අබේසිංහ මහත්මියටත් මගේ සංගීත කටයුතු වලට අතදුන් වාසනා වීරකෝන් මහත්මියටත් ස්තුතිවන්ත වෙනවා. සිසිර විජේතුංග ඔස්කා පෙරේරා යන මහත්වරුත් මේ වෙලාවේදී මතක් කරන්න ඕනෙ. මට මුලින්ම ප්‍රසාංගික වේදිකාවේ ගී ගයන්න ආරාධනා කළ රොෂාන් ප්‍රනාන්දු මගේ සහෙ-ාදරයාටත් මගේ පියා ඩග්ලස් ප්‍රනාන්දුටත් මගේ අනෙක් සහෝදර සහෝදරියන්ටත් ස්තුති කරනවා.

**ශ්‍රීනාත්**
මට ඇත්තටම පුදුමයි මේ සියලු දෙනාවම කොහෙ-ාමද මතක. සමහර අයට මුලින් උදව් කළ මිනිස්සු අමතකයි.
**ශිරෝමි**
මට එහෙම වෙන්නෙ නෑ ශ්‍රීනාත්. මගේ යම්කිසි සාර්ථකත්වයක් තියෙනවද එයිකට මූලික හේතුව මට ගුරුහරු කම් දුන් අය සිහිකිරීම සහ මුල අමතක නොකිරීම. නමුත් තව හුඟක් අය ඉන්නවා උදව් කළ. නම් වශයෙන් නොකීවාට ඒ සියලු දෙනාම මේ වෙලාවෙ මතක් කරනවා.

**ශ්‍රීනාත්**
ඔබේ සංයුක්ත තැටිය එළි දැක්වීම සඳහා ප්‍රසංගයක් පවත්වන බව ඇනගන්න ලැබුණා. මේ ප්‍රසංගය ගැන යමක් අපට කියනවද?

**ශිරෝමා**
මගේ ගී තැටිය ඔස්ට්‍රේලියාවේ එළිදැක්වීමේ ප්‍රසංගය මාර්තු 18 වන දා සවස 6.30 ට කෙල් වොට්සන් රඟහලේදී පැවැත්වෙනවා. මේ ප්‍රසංගය ඉතා හොඳින් සංවිධානය කරන්න මම උත්සාහ කරනවා.

**ශ්‍රීනාත්**
කව්ද ඔබ සමග එක් වන කට්ටිය?




# උතුම් කරුණු සතරක්

**පසේනදී කොසොල් මහරජ ඇරැබ**
**සැවැත් නුවර - දෙව්රම් වෙහෙර**

ආරෝග්‍යා පරමා ලාභා
සන්තුට්ඨි පරමං ධනං
විස්සාස පරමා ඤාතී
නිබ්බාණං පරමං සුඛං

උතුම් ලාභය නම් නිරෝගී බවයි
උතුම් ධනය නම් සිතේ සතුටයි
හොඳම නෑයා නම් විශ්වාසයයි.
උතුම් සැපය නම් නිවන් සුවයමයි.

ˀrogya parama labha
Sabtutthi paramam dhanam
Vissasa parama nati
Nibbanam paramam sukham.

Health is the highest gain
Contentment is the greatest wealth
The trusty are the best kinsmen
Nibbana is the highest bliss

සැවැත්නුවර පසේනදී කොසොල් රජතුමා බුදු හිමියන් දැකීමට නිතර යන එන රජ කෙනෙකි. රජතුමා දිනක් දිවා ආහාරය ගෙන මඳක්වත් විවේකයක් නොගෙන බුදු හිමියන් බැහැ දැකීමට වෙහෙරට ගොස් එකත් පසව හිඳ පිළිසඳර කථාවෙහි යෙදුණි.
රජතුමාට මඳ වේලාවකින්, ආහාරයෙහි මත් ගතියෙන් හටගත් නිදිමත නිසා ඈණුම් අරිමින්, ඇඹරෙමින්, නොසන්සුන්ව සිටින අයුරු දැක බුදු හිමියන් කොසොල් රජතුමාගෙන් මෙසේ විමසීය.

බුදු හිමියන් -- කිමෙක්ද මහරජ, දිවා ආහ-ාරයෙන් පසු මඳක්වත් විවේක නොගෙන නොසැතපී ආයේද?
මහරජ -- එසේය ස්වාමීනි, ආහාර වැළඳු වේලේ පටන් කයට පීඩා බොහෝ ය.
බුදු හිමියන් -- මහරජ, පමණ දැන ආහාර වැළඳීම කයට සුව පහසු බවට හේතුවේ යැයි වදළේය.
කොසොල් මහ රජතුමා ඒ උතුම් අවවාදයෙහි පිහිටා දිනපතා එක එක බත් පිඩ බැගින් අඩුකොට වැළඳීමෙන්, අවසාන කෙටි ආහාර වේල් නිසා සිරුරට සුව පහසුව ඇති වී ශක්තියද වැටුණි.
රජතුමාගේ සිරුරට ලැබුණු සුව පහසුව සහ ශක්තිය නිසා බොහෝ සතුටින් කල් යැවුවේ ය. බුදු හිමියන් බැහැ දැකීමට ගොස් ''දැන් මට ඉතා පහසු ය. සිරු-රෙහි බලද වැඩුණෝ ය. හස්තියෙකුගේ පිටට ද දැන් මට බිම සිට පැනීමට පුළුවනැ'' යි බුදු හිමියන්ට සැල කළේ ය.
බුදුරජාණන් වහන්සේ ඒ නිමිති කොට ගෙන නිරෝගීකම උතුම් ලාභය බව ද, සතුට උතුම් ධනය බව ද, හිතවත්තු උතුම් නෑයෝ බව ද, නිවන උතුම් සැපය බව ද වදාළ සේක.

## කවි කොළය

*නිල සංචාරයට ගොස් මහජන චීනේ*
*ජනපති තුමා ගෙන ගිය අලි තෑග්ගට*
*මදි අඩු පාඩු කියනව නම් එහෙම නෙමෙයි*
*හොඳටම හිතා බලලයි කවියට නැඟුවේ*

*මහ අලි රංචුවම ජනපති සාක්කුවේ*
*ගාලත් කඩාගෙන පොරකන ඉලව්වේ*
*තව අලි දෙතුන් දෙනෙකුට හෙණ්ඩුව දීලා*
*යැව්වත් යෙහෙකිමය උගෙ තනි නොතනියට*

වෙත්තසිංහ